# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## 2006 අංක 7 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කලේ 2006 මාර්තු මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2006 මාර්තු මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල :** රු. 5.50 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

**2006 අංක 7 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2006 මාර්තු මස 27 වන දින]

එල්. ඩී.–ඕ. 64/2004.

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2006 අංක 7 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** 1998 අංක 28 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) 286අ වගන්තියට අදාළ සටහන්වලට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන් ඇතුළත් කිරීමෙන් :—

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| "286ආ | ළමයකු ලිංගික අපයෝජනය කිරීම වැළැක්වීම පරිගණකය භාවිත කිරීම මගින් සේවා සපයන තැනැත්තකු විසින් පැහැර හැරීම. | එම | එම | එම | එම | අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| "286ඇ | ළමා අපයෝජනය සඳහා පරිශ්‍රයන් භාවිත කිරීම ගැන දැනුම්දීම පැහැර හැරීම. | එම | එම | එම | එම | අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම.". | මහෙස්ත්‍රාත් අධිකරණය |

(2) 349 වන සටහනට ඉක්බිතිව ම ඇති ශීර්ෂය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ශීර්ෂය ආදේශ කිරීමෙන් :—

"ළමයින් අපහරණය කිරීම, පැහැරගෙන යාම, කුට්ටනය කිරීම, ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම, තැනැත්තන් වෙළෙඳාම් කිරීම, ණය බැඳුම්කරයකට පත්කිරීම, දාසභාවය, බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩගැනීම, වහල්භාවය, සන්නද්ධ අරගලවල යෙදවීම සඳහා ළමයින් බඳවා ගැනීම, ළමයකු දරුකමට හදාගැනීම හා සම්බන්ධ වැරදි සහ ළමයකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීම".

(3) 358 වන වගන්තියට අදාළ සටහන්වලට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන් ආදේශ කිරීම :—

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 358අ | "ණය බැඳුම් කරයකට හෝ දාසභාවයට පත් කිරීම බලහත්කාරයෙන් හෝ අනිවාර්ය යෙන් වැඩ ගැනීම හෝ වහල් කමට භාජනය කිරීම. | එම | එම | එම | එම | අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම සහ දඩය. |
| | ළමයකු සම්බන්ධයෙන් වනවිට ණය බැඳුම්කරයකට හෝ, දාසභාවයට පත් කිරීම. බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩගැනීම, වහල්භාවයට භාජනය කිරීම, හෝ සන්නද්ධ අරගලයක යෙදවීම සඳහා ළමයකු යොදා ගැනීම හෝ බඳවා ගැනීම". | එම | එම | එම | එම | අවුරුදු තිහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම සහ දඩය |

(4) 360ඇ වගන්තියට අදාළ සියලු සටහන් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන් :—

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| “360ඈ | තැනැත්තන් වෙළෙඳාම කිරීම | වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගනු ලැබිය හැකිය. | එම | එම | එම | අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම සහ දඩ මුදලකින් දඬුවම් කරනු ලැබිය හැකිය. |
| | වරද ළමයකු සම්බන්ධයෙන් සිදුකරනු ලබන අවස්ථාවකදී | එම | එම | එම | එම | අවුරුදු තුනකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම සහ දඩ මුදලකින් ද දඬුවම් කරනු ලැබිය හැකිය. |
| 360ඈ | ළමයින් දරුකමට හදාගැනීම හා සම්බන්ධ වැරදි | එම | එම | එම | එම | අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකම. |
| 360ඉ | ළමයකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීම. | එම | එම | එම | එම | අවුරුදු දහයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකම.”. |

(5) 365ආ වගන්තියට අදාළ සියලු සටහන් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් සටහන් ආදේශ කිරීමෙන් :—

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| "365ආ | බරපතල ලිංගික අපයෝජනය | එම | එම | එම | එම | අවුරුදු පහකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීම සහ දඩය සහ වන්දියක්. |
| | වරද සිදුකරන ලද්දේ වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු සම්බන්ධයෙන් වන අවස්ථාවකදී | එම | එම | එම | එම | අවුරුදු හතකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීම සහ දඩය සහ වන්දියක්.". |

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.